# LIFE TALK.com

## වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් අත්පොත

## 2021-2022



ශ්‍රී ලංකාව මේ වන විට විවිධ සමාජ ගැටළු ගණනාවකට මුහුණ දී සිටී. මිනිසෙකුගේ උපතේ සිට මරණය දක්වාම මෙම සමාජ ගැටළු වලට මුහුණ දී බොහෝ මිනිසුන් හෙම්බත්ව සිටී. සමස්ථ ජන සමාජයටම මෙම ගැටළු අතික්‍රමණය කිරීමේ හැකියාවක් නොමැතිකම නිසාම, බුද්ධිමත් ජන සමාජය විසින් අතිමහත් ජනතාවක් මුහුණ දෙන ගැටළු මගහරවා ගැනීමටත්, ඉන් මිදීම සඳහාත් මගපෙන්වීමට මැදහත්වීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා ශ්‍රී ලංකාවේ සියළු බුද්ධිමතුන්ගේ සහභාගීත්වයත්, මැදිහත්වීමත්, මැදිහත්කරවා ගැනීමත් අතිශයින්ම වැදගත් කාරණයකි. ගෝලීයව මෙන්ම රටක් වශයෙන්ද මුහුණදී සිටින කොවිඩ් වසංගත අර්බුදය හමුවේ මෙම මැදිහත්වීම අතිශය තීරනාත්මක වී ඇත. ඒ නිසාම මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මෙය ජාතික වගකීමක් සේ සලකා, පවත්නා හිඩැස පිරවීම වෙනුවෙන් සංවාදානාත්මක - අන්තර්ජාල - බුද්ධිමය සංවාදයක් නිර්මාණය කිරීම සඳහා සිදුකරනු ලබන උත්සාහයයි මේ.

**මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**
**94-112- 187160**

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 01

## සෑම සඳුදා දිනකම

සුපසන් පෙර පාසල් පද්ධතියක් උදෙසා, පෙර පාසල් ගුරුවරුන් සඳහා

**"සොඳුරු විල" - වෘත්තීය මාර්ගෝපදේශය**

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

මේ වන විට පෙර පාසල් පද්ධතිය රාජ්‍ය අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව, පෙර පාසල් පද්ධතිය ක්‍රියාත්ම වන ආකාරය නියාමනය කිරීම සඳහා පෙරපාසල් සම්බන්ධ විෂය අමාත්‍යාංශයක් යටතට පත් කර ඇත. ශ්‍රී ලංකාව තුල පෙර පාසල් ගුරුවරුන් 18000 පමණ ඉගැන්වීමේ යෙදෙන බවට ඇස්තමේන්තුකර ඇත.

මාරියා මොන්ටිසෝරි මැතිනියගේ සංකල්පය වූයේ පෙර පාසල් තුලින් දරුවන්ට අකුරු හැකියාව හුරු කිරීම නොවේ. වයස අවුරුදු 5 සම්පූර්ණ කරනු ලබන දරුවෙකු ඍජුවම පාසල් ගත කිරීමේදී එම දරුවා නුහුරු පරිසරයකට එක්වරම මුදුහැරීමේදී සිදුවන මානසික හා සමාජයීය ගැටළු වලක්වා ගැනීමයි. එහිදී දරුවාගේ අකුරු හුරුව නොමැතිව, අනෙක් සියළු හැකියාවන් උද්දීපනය කරවා ගැනීමට මෙය මහෝපකාරී වන බව ඇය විසින් පෙන්වා දුන්නාය. විශේෂයෙන්ම දරුවා සමාජ ගතවීම, නිවෙසේ පරිසරයෙන් බැහැරව ජීවත්වීමේ කුසලතා හුරු කිරීම, දරුවා තමාගේම වයසේ දරුවන්ගේ ඇසුරට හැරු කිරීම, දෙමව්පියන්ගෙන් ඈත්ව කෙටිකාලයක් ජීවත්වීමට දරුවා පුහුණු කිරීම, ඉතා කුඩා තීසෘණ තනිව ගැනීමට හුරු කිරීම, දරුවෙකුගේ චාලක කුසලතා, කථන හැකියාව හා සවන්දීම වැනි කුසලතා මතුකරවා ගැනීම ඒ අතර වේ.

අපගේ අරමුණ වන්නේ දරුවෙකු ඉහත කරුණු ඉටුවන පෙර පාසල් පද්ධතියක් තුළ කටයුතු කරනු දැකීමයි. මෙහිදී , විවිධ විෂය මාතෘකා යටතේ පෙර පාසල් පද්ධතියක මුඛ්‍ය පරමාර්ථය පිළිබඳව පෙර පාසල් ගුරුවරුන් දැනුම්වත් කිරීම හා දරුවෙකු වෙනුවෙන් පෙර පාසලකින් සිදුවිය යුතු ක්‍රියාවලිය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම සිදුකිරීමට අපේක්ෂා කෙරේ.
වර්තමානයේ පෙරපාසල් පද්ධතිය තුල ඉගැන්වීම සිදුකරනු ලබන ගුරුවරුන්ගේ අධ්‍යපන තත්වය පිළිබඳව ගැටළු පැන නැගී තිබේ. බොහෝ විට පෙර පාසල් හෝ මුල් ළමා විය අධ්‍යාපන මධ්‍යස්ථාන යනු රැකියාවක් නැති තැන සිදුකරනු ලබන ස්වයං රැකිායවක් පවට පත්වී ඇත.



පෙර පාසල් පද්ධතියේ විවිධ ගැටළු දක්නට ලැබේ. තරඟකාරී ලෙස ඉගැන්වීමට කටයුතු කිරීම මගින් ඉදිරි වසර තුල තමන්ගේ පෙර පාසලට පැමිණෙන ළමුන් ප්‍රමාණය වැඩිකර ගැනීම, විවිධ මට්ටමේ උත්සව සංවිධානය කිරීම වැනි ප්‍රදර්ශනාත්මක ක්‍රියාකාරකම් දක්නට හැකිය.

පෙරපාසලක් දරුවාට ප්‍රිය මනාප ලෙස පවත්වාගැනීමත් ඉන් අපේක්ෂා කරනු ලබන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීමත් මෙවැනි අවස්ථාවලදී බොහෝ පෙරපාසල් වලින් මග හැරී යයි. නව්‍යතාවයට හා තරඟකාරී අනාගතයට දරුවා නිවැරදිව හා විධිමත්ව හුරු කිරීමට නම් , මුල් ළමා විය ගුරුවරයාට ඒ පිළිබඳව මනා පුහුණුවක් හා දැනුමක්ද අවශ්‍ය වේ.

මෙවැනි තත්වයන් හමුවේ අපගේ අනාගත පරපුර නිවැරදි මානසිකත්වයකින් යුතුව දිශාගත කිරීම සඳහා අවශ්‍ය පසුබිම සමාජය විසින් සංවාදාත්මකව නිර්මාණය කළ යුතුය.

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළ පෙර පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම පිළිබඳව පවත්වන සංවාද සිදුකිරීමට වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස ස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් ඒකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 02

## සැම අඟහරුවාදා දිනකම

සුපසන් සොඳුරු කැදැල්ලක් උදෙසා , නව විවාහක කණ්ඩායම් හා ගැබිනි මව්වරුන් සඳහා

### "සොඳුරු පියස" - ජීවන මාර්ගෝපදේශය

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

මේ වන විට බස්නාහිර පළාත තුල පමණක් පවුල් 400 පමණ දෛනිකව දික්කසාද වීමට යොමුවන බව පර්යේෂණ මගින් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ ආශ්‍රිතව වැඩි වශයෙනුත් ග්‍රාමීය පළාත් ආශ්‍රිතව නාගරික ප්‍රදේශ වලට සාපේක්ෂව තරමක් අඩුවෙනුත් මෙම තත්වය පවතී. වර්තමානයේ පවතින විවිධ තාක්ෂණික ක්‍රමවේද භාවිතය ඉහල යාම, අඩුවයසින් සිදුවන විවාහ, විස්තීර්න පවුල් පද්ධතියේ සිදුව ඇති කුටුම්භ වීමත් ආදී වූ ප්‍රමුඛ කරුණු බොහෝ විවාහ දෙදරා යමට හේතුවී ඇත. ඒසේම නිරන්තරයෙන් සිදුවන සමාජයීය හා ආර්ථික වෙනස්කම් දරාගැනීමට නොහැකිවීමත් පවුල් උපදේශනය විෂයක් ලෙස ක්‍රියාත්මක නොවීමත් මේ සඳහා සාධක ලෙස බලපා ඇති බව පෙනේ.

මිනිස් බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවට මෙම ගැටළු අදාල නොවන බව බැලූ බැල්මට පෙනේ. ඒසේ නමුත් ශ්‍රී ලංකාව තුල පවතින විරැකියාව හා සැලකිය යුතු ප්‍රතිශතයක් රැකියාවලින් ඉවත්වීම පිළිබඳව පර්යේෂනාත්මකව සොයා බැලූ විට නිරීක්ෂණය වන්නේ පවුල් පරිසරය තුල පවතින විවිධ අර්බුධකාරීතත්වයන් සෘජුවම ඔවුන්ගේ රැකියාවන් සඳහා බලපාන බවයි. ඒහිදී රැකියාව තෘප්තිමත්ව සිදු නොකිරීමත්, සේව්‍යාට අවශ්‍ය සේවය නිසි පරිදි ලබාදීමට නොහැකිවීමත් සහ පවුල තුල පවතින ගැටුම් වැනි තත්වයන් මේ සඳහා බලපාන බව පෙනේ.

බොහෝ කාන්තාවන් හා ගැහැණු ළමුන් විවාහ වීම, දරුවන් රැකබලා ගැනීම ආදී හේතුනිසා රැකියා සඳහා යොමුවීම අඩු වන බව දක්නට ලැබේ. ඒසේම ගැහැණු ළමුන්ට හා කාන්තාවන්ට වඩාත් ඉහල වැටුප් ලබන රැකියාවන්ට යොමුවීමට නොහැකිවීමද ඉහත හේතූන් පාදකව හා සමාජ පරිසරයේ බලපෑම් නිසා ඇතිවන තත්වයන්ය. මෙවැනි තත්වයන් නිසා ගැටළු වලට මුහුණ දෙන්නේ නව විවාහක කණ්ඩායමය. ඒබැවින් මේ පිළිබඳව සමාජ කථිකාවත් හා සංවාදයක් ඇතිකිරීම ඉතා වැදගත් වේ.



**වැඩසටහනේ අන්තර්ගත විය යුතු ක්‍රියාකාරකම්**

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා

පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළ පවතින ගැඹුරු තත්වය පිළිබඳව විමසා බලමින් සංවාදය සඳහා සඳහා නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම පිළිබඳව අවධානය යොමුකිරීමට වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් එකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 03

## සැම බදාදා දිනකම

දෙනෙහස දොරගලන ආදරනීය කෙම්බිමක් උදෙසා, දෙමාපියන් වෙනුවෙන්

**"සෙනෙහසේ පියස" - ජීවන මාර්ගෝපදේශය**

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ


ශ්‍රී ලාංකේය සමාජ පරිසරයේ අතීතය ඉතා රසවත්ය. විස්තීර්ණ පවුල් පරිසරයක් තුල විශාල සාමාජිකයන් පිරිසක් සමඟ මනා සහයෝගයෙන් යුතුව ඔවුනොවුන්ගේ සහයෝගයෙන් ගොඩනැගුණු පවුල් පරිසරයක් ඒකල දක්නට ලැබිණ.

වර්තමානයේදී පවතින විවිධ ආර්ථික හා සමාජීය ගැටළු නිසාම ඇතිකරගෙන තිබෙන මානසික තත්වයන් මත පවුල් කුටුම්භ බවට පත්ව ඇත. ඒහි මව, පියා සහ දරුවන් දෙදෙනෙකු යන තත්වය දක්වාම පවුල සීමා වී ඇති අතර මවගේ දෙමාපියන් හෝ පියාගේ දෙමාපියන් ඒහි දක්නට නැත. පවතින සංකීර්ණ සමාජ තත්වයන් හමුවේ දරුවන් හා දෙමාපියන් අතර පවතින බැඳීමද බොහෝ දුරස් වී ඇත.

මෙම තත්වය තුල යාන්ත්‍රිකරණයට හුරුවී ඇති මිනිසා රැකියාව වුවද සිදුකරන්නේ යාන්ත්‍රික මිනිසෙකු ලෙසින්මය. ඒහිදී බොහෝ විට සේවයක් ලබාගැනීමට පැමිණෙන්නන් ඉතා අසරන තත්වයට පත්වීමත්, අල්ලස, දූෂනය, පගාව වැනි අක්‍රමිකතා ඉහල යාමත් සිදුවී ඇත. මරණ සහතිකය පවා ලබාගැනීමට පගාව ලබාදිය යුතු තත්වයටම ඒය විනාශ මුඛයට යොමුවී ඇත.

මෙම තත්වය වැලැක්විය හැක්කේ පවුල් පරිසරය නැවතත් යහ පරිසරයක් තුලට කැඳවාගෙන ඒමෙන් පමණක්මය. සංවේදීබව, වගකීම, වගවීම, සාමූහිකත්වය, ආදරනීය බව වැනි මානුෂීය ගුණාංග ප්‍රගුණ කල යුත්තේ කුඩා කල පටන්මය. දරුවන්ට ඒබව කියා දිය යුතුය. වැඩිහිටියන් ඒ ඇසුරෙන් ක්‍රියාත්මක විය යුතුය. මෙම තත්වය ඇතිකිරීම සඳහා වගකීම දැරිය යුත්තේ දෙමාපියන්ය.

රැකියාවක් සිදුකිරීම මෙන්ම ඒ ඇසුරෙන් තමන්ගේ පවුල හා සමාජ පරිසරය ගොඩනංවා ගැනීමට අවශ්‍ය උපදේශනය ලබාදීම ඉතා වැදගත්ය. ඒවිට රැකියා තුලින් රජය බලාපොරොත්තු වන ඉලක්ක ලඟකරගැනීමට ඉතා පහසුවනු ඇත. මේ ක්‍රියාකාරකම් ඒ වෙනුවෙන්ය.



වැඩසටහනේ අන්තර්ගත විය යුතු ක්‍රියාකාරකම්

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. වැඩිහිටියන් සඳහා අධ්‍යාපනය ලබාදීම පහසු කටයුත්තක් නොවන බැවින්, මෙම වැඩසටහන් මාලාව තුළ දෙමාපියන් දැනුවත්කිරීමේ ක්‍රියාවලිය සඳහා නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමටත් ඒ ඇසුරෙන් සංවාද පැවැත්වීමටත් වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘකාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් ඒකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රේක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 04

## සැම බ්‍රහස්පතින්දා දිනකම

අභිමානවත් ගුරු පරපුරක් උදෙසා - ගුරුවරුන් සඳහා

## "අභිමානයේ දෝංකාරය" - වෘත්තීය මාර්ගෝපදේශය

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

වර්තමානයේදී ගුරු වෘත්තිය යම් තරමකින් හැල්ලුවට පත්වී ඇති බව නොරහසකි. 235,000 පමණ වූ ශ්‍රී ලාංකේය ගුරු සමූහයම මෙම අර්බුදයට මුහුණ දී ඇත. උද්දේශනය හඳුනා නොගනිමින් ඒහි අවසන් ක්‍රියාකාරකම වන උද්සෝශණය කරා යොමුවීම නිසාම මෙම අර්බුදය පැන නැගී ඇත.

ගුරුවරයෙකු සතුව පවතින අභිමානය රැකගැනීම සඳහා විධිමත් උපදේශන ක්‍රියාවලියක් ක්‍රියාත්මක විය යුතුම කාලය දැන් ඒළඹ තිබේ. ගුරු වෘත්තියේ වගකීම හා වගවීම පිළිබඳවත්, ගුරුවරයෙකු සතුවිය යුතු කුසලතා පිළිබඳවත් යාවත්කාලීන වීම සිදුවිය යුතුමය. ගෝලීයව නිරන්තරයෙන් සිදුවන තාක්ෂණික වෙනස්වීම් සඳහා සංවේදී ගුරුපරපුරක් නිර්මාණය වීම අඛණ්ඩ හා යාවත්කාලීනව සිදුවිය යුතුය. ඒසේ නොවන තාක් කල් තාක්ෂණික යුගයේ බිහිවන දරුවන් හා කටයුතු කිරීම ගුරුවරයෙක් මුහුණ දෙන අම්හිරි අත්දැකීමක් වීම වැලැක්විය නොහැකිය. ඒක් ස්ථානයක සිට ලෝකය පුරා කටයුතු කළ හැකිව පවතින වර්තමානයේදී වැලිපිල්ලේ ඉගැන්වීමට යාම විහිළුවක් විය හැකිය. ඒ නිසාම ඒයද තාක්ෂණය හා මුසු කිරීමේ වගකීම ගුරුවරයා සතුය. ඒය වැලැක්වීමට නම් ගුරුවරයෙකු තුළ පවතින විභව ශක්තිය ඉස්මතුකිරීම ඉතා වැදගත් වේ.

මේ වන විට වසර 10කට අධික කාලයක් තුළදී වත් විධිමත් පුහුණු කිරීමේ ක්‍රියාවලියකට අනුගතකර නොමැති සමස්ථ ගුරුවරුන් සඳහාම මෙම වැඩසටහන් මාලාව ඉතා යෝග්‍ය වනු ඇත. ඒහිදී ගුරු වෘත්තිය සාම්ප්‍රදායික මට්ටමෙන් ඔබ්බට හා ගෝලීය වෘත්තීය අවස්ථා පදනම්ව ක්‍රියාත්මක වන හා නවීන ක්‍රමවේද, තාක්ෂණය හා නව්‍යතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීම පිළිබඳව මගපෙන්වීමක් ලබාදීමට හේතුකරගත හැකිය.



වැඩසටහනේ අන්තර්ගත විය යුතු ක්‍රියාකාරකම්

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළදී ගුරුවරුන්ගේ වෘත්තීය

හැකියාවන් පිළිබඳව සාකච්ඡා කෙරෙන බැවින් නවා ක්‍රියාකාරකම් ඇතුළත්ව පවත්වන සංවාද සිදුකිරීමට වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් ඒකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 05

## සෑම සිකුරාදා දිනකම

සවිබල ගැන්වුණු නිර්මාණශීලී ශ්‍රමබලකායක් උදෙසා - රැකියා අපේක්ෂකයන් හා උපාධිධාරීන් සඳහා

## “පියාපත්” - වෘත්තීය මාර්ගෝපදේශය

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

ශ්‍රී ලාංකේය ශ්‍රම බලකාය ගෝලීය රැකියා වෙළඳපොල අවශ්‍යතා සපුලීමට සමත්නොවන බව පර්යේෂණ මගින් අනාවරණය වී ඇත. ඒ බව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා රැකියා වෙළඳපොළ පිළිබඳව පිළිබඳව සිදුකර ඇති විවිධ පර්යේෂණ මගින් තහවුරු කර ඇත.

මේ වෙනුවෙන් කටයුතු කිරීම පිළිබඳව සැලකීමේදී මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ වගකීම ඉතා ප්‍රමුඛය. මේ වන විටත් විවිධ ක්‍රමවේද ඔස්සේ මෙම දෙපාර්තමේන්තුව රැකියා වෙළඳපොළ විසින් අපේක්ෂා කරනු ලබන ශ්‍රමිකයන් නිර්මාණය කිරීම පිළිබඳව අන්තර් රාජ්‍ය මට්ටමේ සංවාදයකට ඒළඹ සිටී. වෙළඳපොළ අවශ්‍යතා අනව ශ්‍රී ලාංකේය ශ්‍රම බලකාය සංවිධානය කිරීම සඳහා මේ වන විටත් විවිධ රාජ්‍ය ආයතන කටයුතු කරමින් පවතී. පාසල් අධ්‍යාපනයෙන් පසු තරුණ කණ්ඩායම් පුහුණු කිරීම සඳහා රාජ්‍ය ආයතන ගණනාවක් ඇත. රැකියා අවස්ථා සඳහා සහාය දැක්වීමටත් ඒවැනිම ආයතන බොහෝ ගණනක් පිහිටුවා ඇත. මෙම දෙපාර්තමේන්තුවේ වගකීම වී ඇත්තේ නිසි පරිදි තමන්ගේ හැකියාවන් හඳුනාගැනීඹ සඳහා සියළු කණ්ඩායම් පුහුණු කිරීමත්, ඒම හැකියාවන් ඔස්සේ ප්‍රවීනතාවය ලබාගැනීම සඳහා කටයුතු කිරීමට මගපෙන්වීමත්ය.

විශේෂයෙන්ම විවිධ කණ්ඩායම් මේවන විටත් ආරම්භ කර ඇති ස්වයං රැකියා සහ කුඩා පරිමාන රැකියා නව්‍යතාවයෙන් යුතුව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීමත් ශ්‍රී ලංකාව පුරා සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති මානව සම්පත් නිලධාරීන්ගේ වගකීම වේ.



මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ඉලක්ක ගත පිරිසට සහාය වන ආකාරයෙන්, නව තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ ක්‍රියාත්මක වෙමින් තවදුරටත් ශ්‍රී ලංකාව පුරා අවිධිමත්ව, අනාගතය සොයාගැනීමට නොහැකිව වල්මත්ව ජීවත්වන තරුණ කණ්ඩායම් හා ස්ව්‍යංරැකියා වල නියුක්තවන්නන් සඳහා මගපෙන්වීම ලබාදීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමයි.

වැඩසටහනේ අන්තර් ගත විය යුතු ක්‍රියාකාරකම් -

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළ තරුණ කණ්ඩායම්, රැකියා අපේක්ෂකයන් හා කුඩා පරිමාණ ව්‍යවසායකයන් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ සංවාද මාලාවක් පැවැත්වීම සඳහා කටයුතු බල යුතුය. ඒ සඳහා සිදුකරනු ලබන ක්‍රමවේදය තුළට නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම සඳහා වග බලා ගන්න.

ඇ. මෙම ක්රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් ඒකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 06

## සැම සෙනසුරාදා දිනකම

සුපසන් රාජ්‍ය සේවයක් උදෙසා - සියළු රාජ්‍ය සේවකයන් සඳහා

**"බුද්ධි මණ්ඩප" - වෘත්තීය මාර්ගෝපදේශය**

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

රටක් යහපත් හා ගුනාත්මක වීමට නම් බුද්ධිමතුන්ගේ දායකත්වය අත්‍යාවශ්‍ය වේ. යම් රාජ්‍යයක සංවර්ධනයේ ප්‍රමාණය ගණනය කිරීමේදී රටක සිටින බුද්ධිමත්න්ගේ තත්වය සැලකීම ඉතා වැදගත්ය. ඒසේ සිටින බුද්ධිමතුන් ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා දායක කරගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ජාතික සංවර්ධන සැලසුම්වල අන්තර්ගත විය යුතුය.

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව මෙම අරමුණ පෙරදැරිව සම්ස්ථ සමාජයටම සම්බන්ධ විය හැකි ආකාරයෙන් බුද්ධිමත් සමාජ සංවාදයක් පැවැත්වීම සඳහා මෙම වැඩසටහන ඉදිරිපත් කරනු ලබයි.

ඒහිදී විවිධ විෂය පදනම් කරගනිමන් නියමිත දිනයක පවත්වන ආකාරයෙන් වැඩසටහන් මාලාවක් සංවිධානය කිරීම අපගේ අරමුණයි මෙම සියළු වැඩසටහන් විවිධ තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ, සියළු වයස්වල ජන කණ්ඩායම් සඳහා යොමුකිරීමට අපේක්ෂා කරනු ලබයි.

මේ මගින් සමාජය තුල බුද්ධිමත් සංවාදයක් ඇතිකරලීමට අපේක්ෂා කෙරේ. ඒහිදී රටේ ආර්ථිකය, රැකියා, වෙළඳපොළ, සමාජ ගැටළු හා ප්‍රශ්ණ, ජාතික ගැටළු හමුවේ මතුවන අර්බුධ සඳහා විසඳුම් සෙවීම, ගෝලීය ප්‍රවනතා හමුවේ සමාජය මුහුණ දෙන තත්වයන් පරිසර විද්‍යාත්මකව, සමාජ විද්‍යාත්මකව, ආර්ථික විද්‍යාත්මකව මෙන්ම සංස්කෘතික විවිධත්වය සහිතවද සංවාද කිරීම සඳහා මෙම වේදිකාව භාවිතා කෙරේ. ඒ මගින් විවිධ ප්‍රායෝගික විසඳුම් හඳුනා ගැනීමටත්, ඒම විසඳුම් විද්‍යාත්මකව සලකා බැලීමටත්, විසඳුම් ඔස්සේ සැලසුම් සකස් කිරීමටත්, ඒම සැලසුම් ප්‍රතිපත්තිමය තීරණ කරා යොමුකර ක්‍රියාත්මක තත්වයට පත්කිරීමටත් මෙම වේදිකාව හේතුවනු ඇති බව අපගේ අපෙක්ෂාවයි.



බොහෝ විට යාවත්කාලීණ සමාජ ගැටළු හමුවේ රැකියා අරබුදය හා ආර්ථික තත්වය වැනි කරුණු පිළිබඳව සංවාදයට ලක්කිරීම තුල වඩාත් ඉහල සමාජ ප්‍රතිචාරයක් ලබාගැනීම මෙන්ම ඵලදායී වැඩසටහනක් සිදුකිරීමටද අවකාශ සලසනු ඇත.

ඒසේම, මේ වන විට රාජ්‍ය යාන්ත්‍රණය විසඳුම් සොයාගැනීමට උත්සාහ කරනු ලබන සමාජ අර්බුද සඳහා ප්‍රායෝගික හා නිරවුල් විසඳුම් හඳුනාගැනීමට මෙම සංවාදය සැලසුම්සහගතව යොමු කරගත හැකි බව සඳහන් කළ යුතුය.

වැඩසටහනේ අන්තර්ගත විය යුතු ක්‍රියාකාරකම්

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළ බුද්ධිමත් සංවාදයක් ගොඩනැගිය යුතුය. ඒ සඳහා නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කිරීම මගින් පවත්වන සංවාදවල ගුණාත්මක බව ආරක්ෂා කිරීමට වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් එකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.

# "Life Talk.com" මාර්ගෝපදේශන වැඩසටහන් මාලාව
# අංක 07

## සෑම ඉරිදා දිනකම

රටට ණය නැති වැඩකරන පරපුරක් උදෙසා - ව්‍යාපාර ආරම්භ කරනන්නන් හා ව්‍යවසායකයන් සඳහා

**“‘ක්ෂේම භූමි’’ - වෘත්තීය මාර්ගෝපදේශය**

වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජිත කාලසීමාව - 2021 දෙසැම්බර් පළමු වැනිදා සිට

### වැඩසටහනේ අරමුණ

බොහෝ දෙනෙකුට මුදල් ඇත. සංකල්ප නැත. තවත් පිරිසකට සංකල්ප අවශ්‍යතරමටත් වඩා ඇත. මුදල් නැත.

මෙම වැඩසටහනේ මුඛ්‍ය අරමුණ වන්නේ ව්‍යාපාර සිදුකිරීමට අපේක්ෂාවෙන් පසුවුවද ඒ සඳහා සුදුසු සංකල්ප නොමැති අයට ප්‍රායෝගික සංකල්ප ජනනය කරගැනීම සඳහා මගපෙන්වීමත්, සංකල්ප සහිත කණ්ඩායම් සඳහා ඔවුන්ගේ මූළ්‍ය හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමටත් තළමණාකරණය කරගැනීමටත් සහාය වීමයි.

මෙම ක්‍රියාවලිය ප්‍රමුඛ කොටස් දෙක ඔස්සේම ක්‍රියාත්මක වීම ඉතා වැදගත් වේ. ඒ අනුව වැඩසටහන හරහා හමුවන ප්‍රධාන කණ්ඩායම් දෙකකි. ඒ ඉහතින් දැක්වූ කණ්ඩායම් දෙකයි. ඒසේම මේ වන විටත් විවිධ වෘත්තීන් ආරම්භ කර තනිව ක්‍රියාත්මක වන ස්වයංරැකියා සිදුකරන්නන්ද, කුඩා කණ්ඩායමක් සම්බන්ධ කරගනිමින් ව්‍යාපාර ක්‍රියාත්මක කරනු ලබන කුඩා පරිමාණ ව්‍යවසායකයන්ද වේ. සංවාද මණ්ඩපයමගින් මේ සියළු කණ්ඩායම් ආමණ්ත්‍රණය කරනු ලබන ආකාරයෙන් ක්‍රියාත්මක වීම ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ වෙළඳපොළ අපේක්ෂා කරනු ලබන සැපයුම ලබාදීමට බොහෝ කුඩා පරිමාණ ව්‍යවසායකයන් අපොහොසත් වේ. සාමාන්‍ය මට්ටමේ ඒළවළු වෙළඳ සැලකට ඒහා ගිය විධිමත් ඒළවළු වෙළඳ සැල් මහාපරිමාන ව්‍යවසායකයන් අතින් නිර්මාණය වන්නේ ඒ නිසාය. ව්‍යාපාරයේ පැවතිය යුතු විධිමත් බව, පිරිසිදු බව වැනි තත්වයන් මගින් බොහෝ විට ඉහල මුදල් ඉපයීමක් සිදුකළ හැකිය. ඒ පිළිබඳව කුඩාපරිමාණ ව්‍යවසායකයන් තුල පවතින්නේ අඩු දැනුමකි. ඒසේම නවීණ තාක්ෂනය භාවිතයෙන් සිදුකළ හැකි වෙළඳාම පිළිබඳව ඇති දැනුමද ඉතා අල්පය. වෙළඳපොල ඉල්ලුමට අනුව සැපයීම සිදුකරනවාට වඩා කුඩාපරිමානයේ වෙළඳුන් විසින් සිදුකරන්නේ තමන් කැමති භාණ්ඩ හා සේවා වෙළඳපොළට නිකුත් කිරීමයි. ඒසේ නැතම් තවකෙකු කරනු දැක ඒ් හා සමාන වෙළඳ සැලක් ආරම්භ කිරීමයි.



වෙළඳපොළ හැසිරීම, ඉල්ලුම හා සැපයුම් පිළිබඳව හා ඒ ඇසුරෙන් පැන නගින ගැටළු මෙන්ම විසඳුම් සඳහා යොමුවීමට අවශ්‍ය මාර්ගෝපදේශ මෙම ලබාගැනීම සඳහා අවශ්‍ය පසුබිම වැඩසටහන තුල නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ.

වේ. ඒසේම මුදල් කළමණාකරණය කිරීම, ව්‍යාපාර කළමණාකරණය ආදී විෂයන් පිළිබඳවද ප්‍රමාණවත් දැනුමක් ලබාදීම වැදගත් වේ.

මෙම වේදිකාව ඒ සඳහා භාවිතා කළ හැකිය.

වැඩසටහනේ අන්තර්ගත විය යුතු ක්‍රියාකාරකම්

අ. ඔබගේ වැඩසටහන නිර්මාණය කරගැනීම සඳහා ඔබගේ හැකියාවන්, අත්දැකීම් හා පළපුරුද්ද ප්‍රයෝජනයට ගන්න. අවශ්‍ය නම් අත්දැකීම් සහිත අයගේ සහයෝගය ලබාගන්න.

ආ. මෙම වැඩසටහන් මාලාව තුළ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ගේ හා ස්වයංරැකියා කරන්නන්ගේ අභාවෘද්ධිය ඉටුවන ආකාරයෙන් ක්‍රියාත්මක විය යුතුය. ඒ සඳහා සඳහා නව්‍ය ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් පවත්වන සංවාද සිදුකිරීමට වග බලා ගන්න.

ඇ. මෙම ක්‍රියාකාරකම් සිදුකිරීමේදී විවිධ විෂය මාතෘකා හෝ ඒකම විෂය මාතෘතාවක් තුල අඛණ්ඩව අවස්ථා කීපයක් සිදුවන වැඩසටහන් ලෙස සිදුකිරීමට හැකියාව ඇත.

ඈ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව යම් නියමිත කාලසීමාවක් සඳහා ඔබගේ වැඩසැලැස්ම නිශ්චිතව හඳුනා ගන්න.

ඉ. වැඩසටහන ආරම්භ කිරීමට පළමුව ඔබගේ සම්පත් දායකයන්ගේ ලැයිස්තුව නිසි පරිදි සකස්කර ගැනීම හා දෛනික වැඩසටහන් සඳහා සම්බන්ධ වන සම්පත් දායකයන් නිවැරදිව හඳුනාගන්න .

ඊ. වැඩසටහන සඳහා අවශ්‍ය පෙර දැනුම් දීම්, තාක්ෂණික සම්බන්ධතාවය, සම්බන්ධ කරගන්නා පිරිස ආදී වශයෙන් අවශ්‍ය සියළු කරුණු පිළිබඳව චෙක් ලිස්ට් ඒකක් සකසා ඒවා සම්පූර්ණ දැයි විමසා බලන්න .

උ. ඔබගේ වැඩසටහන පිළිබඳව ප්‍රතිපෝෂණයක් ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්න. ඒය සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ ඇගයීමට ලක්කර වැඩසටහනේ ඵලදායීතාවය පිළිබඳව මාසිකව වාර්තාවක් සකස් කරන්න.

ඌ. මෙම වැඩසටහන බාහිර ආයතන සමඟ සම්බන්ධ වන බව හෝ සම්බන්ධ කළ හැකි බව ඔබට වැටහෙනු ඇත. ඒවැනි ආයතන, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හඳුනාගනිමින් ඒකාබද්ධ වැඩසටහනක් ලෙස සංවිධානය කිරීමටත්, වැඩසටහන පැවැත්වෙන දින වලදී ප්‍රෙක්ෂකයන් සම්බන්ධ කරගැනීමට ඒම ජාලය භාවිතා කිරීමටත් වැඩපිළිවෙළක් සකසා ගන්න.

ඒ. ඔබගේ සියළු වැඩසටහන් වල ප්‍රගතිය සමස්ථ වැඩසටහන සම්බන්ධීකරණය තුළ නිර්මාණය කර ඇති ඇගයීම් පත්‍රිකාව සඳහා ලබාදීමට කටයුතු කරන්න. ඒ සඳහා සහභාගී වූ ප්‍රමාණය හා ප්‍රතිචාර වල සංඛ්‍යාත්මක ප්‍රතිචාරය වැදගත් වේ.